# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/57/2018 (NPC)

කැටගොඩ ගමගේ නලීන් පෙරේරා
**අභියාචක**
**එදිරිව**
ජාතික පොලිස් කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය :-2026.03.10.**

ඉදිරියේ දී :- විනිසුරු කේ.ටී.චිත්‍රසිරි (සභාපති)
පුද්ගලික හේතුවක් මත මෙම අභියාචනය විමසීමෙන් ඉවත්ව සිටී.
ජේ.ජේ.රත්නසිරි (සාමාජික)
එස්.නන්දසේකරන් (සාමාජික)

පෙනී සිටීම :- අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක තිස්ස ගුණතිලක මහතා
ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්‍ෂක මාලා බස්නායක මහත්මිය.

## -<u>නියෝගය</u>-

**ජේ.ජේ.රත්නසිරි මැතිතුමා (සාමාජික) පරි.අභි.විනි. අධිකාරය.**

අභියාචක 1992.08.12 දින උප පොලිස් පරීක්‍ෂකවරයෙකු ලෙස විශේෂ කාර්ය බලකාය යටතේ පොලිස් සේවයට එක්වී ඇත. 1998.04.16 දින පොලිස් පරීක්‍ෂක තනතුරට සහ 2006.01.01 දින ප්‍රධාන පොලිස් පරීක්‍ෂක තනතුරට උසස්වීම් ලැබ, 2018.07.10 දින සහකාර පොලිස් අධිකාරී තනතුරට උසස්වීම් ලබා ඇත. අභියාචක තමාට සහකාර පොලිස් අධිකාරී තනතුරට 2018 වසරේ ලැබුණ උසස්වීම, 2014.01.13 දිනට පෙරදාතම් කර දෙන ලෙසට ජාතික පොලිස් කොමිෂන් සභාවෙන් ඉල්ලීමක් කර ඇති අතර, 2028.02.02 දින ජාතික පොලිස් කොමිෂන් සභාව මෙම

ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇත. මෙම තීරණයට එදිරිව අභියාචක 2018.03.07 දින මෙම අධිකාරයට අභියාචනයක් ඉදිරිපත් කරමින් ඉල්ලා සිටින්නේ,

I. මෙම අභියාචනය භාරගෙන එය විභාගය සඳහා නියම කරන ලෙසත්,

II. අභියාචක තම අභියාචනයෙන් පෙන්වා දී ඇති පරිදි 2014.09.15 වන දිනට අයදුම්පත් ඉදිරිපත් කරන ලද සහ ඉන් සහකාර පොලිස් අධිකාරී තනතුරට උසස් කරන ලද නිලධාරීන්ගේ සුදුසුකම් සහ ලබාගෙන ඇති ලකුණු ප්‍රමාණයන් ගරු විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කිරීමට නියෝග කරන ලෙසත්,

III. එම ලේඛන සම්බන්ධයෙන් ගරු විනිශ්චය අධිකාරයේ අවධානය යොමු කරන ලෙසත්,

IV. ඒ අනුව අභියාචකගේ සුදුසුකම් පරීක්ෂා කර, 2014.09.15 වන දිනට උසස් කර ඇති සහකාර පොලිස් අධිකාරීවරුන් අතරට අභියාචකද ඇතුළත් විය යුතු බවට තීරණය කරන ලෙසත්,

V. ගරු පරිපාලන විනිශ්චය අධිකාරයට සුදුසුයැයි සළකන වෙනත් සහනයන් සහ ප්‍රදානයන් ලබාදෙන ලෙසත් ය.

මෙම ඉල්ලීම සනාථ කිරීම සඳහා X.1 – X.16 දක්වා ඇමුණුම් ලෙස ලිපි ලේඛන රැසක් ඉදිරිපත් කර සිටී. එයට අමතරව අභියාචක 2020.02.24 දින සංශෝධිත අභියාචනයක් ඉදිරිපත් කරමින් තමාගේ සහකාර පොලිස් අධිකාරී තනතුර 2014.01.13 දින සිට පෙරදාතම් කරන ලෙසත් දන්වා සිටී. එමෙන්ම විවෘත අධිකරණයේ දී වාචිකව කරුණු දක්වා සිටි අතර, 2026.01.05 දින ලිඛිත දේශනයක්ද ඉදිරිපත් කර ඇත. එම ලිඛිත දේශනය සමඟ ද ලිපි ලේඛන රැසක් අමුණා ඉදිරිපත් කර ඇත. අදාළ සියළු කරුණු අනුව අභියාචක දන්වා සිටින්නේ,

(01) 2007 වසරේ සිට තමා ප්‍රභූ ආරක්ෂක අංශය යටතේ රාජගිරියේ කඳවුරක සේවය කරන ලද බව,

(02) 2010.12.26 දින සිදුවූවා යැයි පැවසෙන විනය විරෝධී කටයුත්තක් නිසා, 2011.02.10 දින වැඩ තහනමට ලක්වූ බව,

(03) 2011.03.18 දින චෝදනා 3ක් සහිත චෝදනා පත්‍රයක් ලබා දී ඇති බව.

(04) 2012.09.10 දින නැවත සේවයේ පිහිටුවීමට ක්‍රියාත්මකවීම

(05) 2013.09.21 දින විනය පරීක්ෂණය අවසානයේ අදාළ චෝදනා පත්‍රයේ සඳහන් වැරදි 2/3 සඳහා වරදකරු කළ බවත්, දඬුවම් ලෙස වැටුප් වර්ධන 01ක් වසර දෙකක් සඳහා විලම්භනය කළ බවත්,

(06) ඒ තීරණයට විරුද්ධව 2013.12.23 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අභියාචනයක් කළ බවත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව තම අභියාචනය පිළිගෙන 2015.05.13 දින නියෝගයක් ලබාදුන් බවත්, අදාළ නියෝගය මගින් මුල් දඬුවම ඉවත් කර, තමා නිදොස් කර නිදහස් කළ බවය. එසේම වැඩ තහනමට ලක්වී සිටි කාලයට හිඟ වැටුප් ගෙවීම ක්‍රියාත්මක කරන ලෙස උපදෙස් දී ඇති බවත්,

(07) එසේ වුවත් පොලිපති විසින් අදාළ තීරණය තමාට ලබා දී ඇත්තේ, 2017.01.03 දින බවත්, (වසර දෙකකට පසුව)

08. මේ නිසාම 2014 අගෝස්තු මාසයේ සහකාර පොලිස් අධිකාරී තනතුර සඳහා ඉල්ලුම්පත්‍ර කැඳවන අවස්ථාවේ තමාට ඉදිරිපත් වීමට අවස්ථාව නොලැබුණ බවත්,

(09) 2014.01.13 දින අදාළ සුදුසුකම් සපුරා තිබූ බවත්, 2015.05.29 දින සම්මුඛ පරීක්ෂණයට තමා පෙනී සිටියා නම් කඩඉම් ලකුණු සීමාව වන ලකුණු 75 ඉතා පහසුවෙන් තමාට උපයා ගැනීමට හැකියාව තිබුණ බවත් ය.

(10) මෙම අවස්ථාවේ උසස්වීම් ලැබූ අය අතරින් තමාගේ සම තත්ත්වයේ නිලධාරීන් සහකාර පොලිස් අධිකාරී තනතුරට පත්ව ඇති බවත්, තමාට වඩා ජ්‍යෙෂ්ඨත්වයෙන් පහළ අයද පත්වීම් ලබා ඇති බවත් පරිපාලන දෝෂ නිසා තමාට මෙම අවස්ථාව අහිමිව ඇති නිසා, තමාගේ පත්වීම් දිනය පෙරදාතම් කර දෙන ලෙසත් ය.

මේ කරුණ පිළිබඳව ප්‍රතිඋත්තර රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සහ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ලබා දී ඇත. ඒ අයගේ තීරණය අනුව,

(1) ජාතික පොලිස් කොමිෂන් සභාවේ 2018.05.11 දින නිරීක්ෂණ,

(2) ජාතික පොලිස් කොමිෂන් සභාවේ 2019.11.14 දින නිරීක්ෂණ සහ අදාළ ඇමුණුම්,

(03) 2021.12.02 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණ,

(04) 2022.07.12 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණ හා ඇමුණුම්,

(05) 2026.03.10 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණ පිළිබඳව අවධානය යොමු කරන ලදි.

2022.07.12 රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ අනුව සහකාර පොලිස් අධිකාරී තනතුර සඳහා අයදුම්පත් කැඳවන ලද ප්‍රසිද්ධ දැන්වීම අනුව සුදුසුකම් ලෙස,

1. candidates should be
   a) A Chief Inspector of police in the SLF.
   b) Confirmed in the rank.
   c) In Possession of an unblemished record of service during the past five years period immediately before the date of 13.01.2014.

Note : 1. All the qualifications will be considered to the date of 13.01.2014.

Note : 2. A blemish includes any disciplinary punishment described in section 24 of chapter XLVIII of the establishment cade, punishment by any court of law stricture passed on the official conduct of an officer by the supreme court (The applicant who has a blemished record will disqualified)

මෙයට අමතරව ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද 2018.05.11 දින නිරීක්ෂන වාර්තාවේ 07 ඡේදය අනුව,

07. පොලිස් විශේෂ කාර්ය බලකායේ පැවැති සහකාර පොලිස් අධිකාරී තනතුරේ පුරප්පාඩු 15ක් සම්පූර්ණ කිරීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් පවත්වා පුරප්පාඩු 15 සම්පූර්ණ කර 2014.01.13 දින සිට සහකාර පොලිස් අධිකාරී තනතුරට උසස්වීම් ලබා දී ඇත.

I. ප්‍රධාන පොලිස් පරීක්ෂකයෙකු වීම

II. තනතුරේ ස්ථිර කර තිබීම

III. 2014.01.13 දිනට පෙර වසර 05ක නොකැළැල් සේවා කාලයක් තිබීම

2014.01.13 වන දිනට පොලිස් විශේෂ කාර්ය බලකායේ ප්‍රධාන පොලිස් පරීක්ෂකවරුන්ට සහකාර පොලිස් අධිකාරි තනතුරට උසස්වීම් ලබාදීම සඳහා පැවති සම්මුඛ පරීක්ෂණයට අභියාචක අයදුම්පත් ඉදිරිපත් කර නොමැති අතර, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සඳහා කැඳවීමක් කර නොමැත. මේ කාලය වන විට අභියාචක ඔහුගේ විනය දඬුවම ඉවත් කර ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අභියාචනයක් කර තිබූ අතර, එහි නියෝගය ලැබී ඇත්තේ ඉහත කී සහකාර පොලිස් අධිකාරි තනතුරට අදාළව උසස්වීම් පිරිනැමීමෙන් අනතුරුව එනම් 2015.05.13 දින දීය.

08. සේවා කාලය හා කුසලතාවය මත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් වෙත ඉදිරිපත් වී නියමිත ලකුණු ප්‍රමාණයකට අනුව සුදුසුකම් ලැබූ නිලධාරීන් පැවැති පුරප්පාඩු අනුව උසස්වීම් ලබා දී ඇති බැවින් එම පරීක්ෂණ මණ්ඩලයට පෙනී නොසිටි අභියාචකට උසස්වීමක් ලබාදීමට නිර්දේශයක් කළ නොහැකි බව නිරීක්ෂණය කළ ජාතික පොලිස් කොමිෂන් සභාව අභියාචනය ප්‍රතික්ෂේප කළ බව අභියාචකට දන්වා ඇත.(ඇමුණුම් 2)

මේ තීරණය බැහැර කිරීම අපහසුය. එසේම එයට අමතරව අභියාචක දන්වා සිටින පරිදි, ඔහුට පහසුවෙන් ලකුණු 75ක් ලබාගැනීමට හැකි බව ප්‍රකාශ කළද, අයදුම්කරුගේ සේවා කාලය අනුව ඔහුට උපරිම ලැබෙනුයේ ලකුණු 40ක් පමණි. නමුත් අදාළ ලේඛණයේ ජ්‍යෙෂ්ඨත්වයට ලකුණු 50ක් ලැබූ නිලධාරීන් දෙදෙනෙකු සිටි අතර, ඒ දෙදෙනා අදාළ තනතුර සඳහා තෝරාගෙන නැත. ඉදිරිපත් වූ අයදුම්කරුවන් 39 දෙනා අතුරින් සහකාර පොලිස් අධිකාරි තනතුර සඳහා තේරී ඇත්තේ 15ක් වන අතර, අයදුම්කරුවන් 39 දෙනා අතරින් 37 දෙනෙකුම 2006 වසරේ ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුර ලැබ සම තත්ත්වයේ සිටි නිලධාරීන් ය.

මෙහිදී පෙන්වා දීමට ඇති තවත් ප්‍රධාන කරුණක් වන්නේ, 2019.01.09 දින සහකාර පොලිස් අධිකාරි තනතුරු ලැබූ 11 දෙනා අතරින්, අභියාචක ලැබූ ලකුණු අනුව තේරී ඇත්තේ 09 වැනි ස්ථානයටය. ඒ අනුව

2014 වසරේ සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වුවා නම්, 15 දෙනා අතරට ස්ථිර ලෙසම තේරීම සඳහා ඉඩක් තිබුණාද යන ප්‍රශ්නය තදින් සළකා බැලිය යුතුය. කෙසේ වුවත්, අදාළ කාලය තුළ නියමිත සුදුසුකම් සපුරා නොමැති වීමත්, එසේම අදාළ සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්පත්‍ර ඉදිරිපත් නොකළ අයෙකු සඳහා පෙරදාතම් කර පත්වීමක් ලබාදීමට හැකියාවක් නොමැත. ඒ අනුව ජාතික පොලිස් කොමිෂන් සභාවේ තීරණය ස්ථිර කරමු. ඉල්ලුම්කරුගේ අභියාවනය ප්‍රතික්ෂේප කිරීමට තීරණය කරමු.

අභියාවනය නිෂ්ප්‍රභ කිරීමට තීරණය කරමු.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-